Article 12(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019 - 08 - 21 |

පැමිණිලිකාර පාර්ශවය : ප්‍රියංග ගුරුගේ මහතා,
අංක 3/ඒ, තිස්සාරාම මාවත,
මහනුවර.

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : HRC/K/536/16</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතු වන යොහාන් අරෝෂණ ගුරුගේ 2017 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ පදනම යටතේ ආගමික ප්‍රතිශතය මත මහනුවර කිංස්වුඩ් විදුහල, මහානාම විදුහල, ධර්මරාජ විදුහල, සිල්වෙස්තර විදුහල, යන පාසැල් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලද බවත්, එහිදී පැමිණිලිකරු ක්‍රිස්තියානි භක්තිකයකු වන බැවිනුත් සිල්වෙස්තර විදුහල රෝමානු කතෝලික පාසලක් වන බැවිනුත් ඔහුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බවත්, නමුත් අනෙකුත් පාසැල් වන මහානාම විදුහල, ධර්මරාජ විදුහල යන පාසල් මඟින් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණය වෙත කැඳවා ලකුණු ලබා දී ඇත. නමුත් මෙහිදී මහනුවර මහනගර සභාවට අයත් පැමිණිලිකරුගේ බදු ඔප්පු ලියකියවිලි පිළිගත නොහැකි බවත් නිශ්චිත ඔප්පුවක් නොමැති බවත් පවසමින් කිංස්වුඩ් විදුහල මඟින් පැමිණිලිකරු විසින් යවන ලද අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බවද සඳහන් කර ඇත.

ධර්මරාජ විදුහල හා මහානාම විදුහල මඟින් මහනගර සභාවට අයත් බදු ඔප්පු ලියකියවිලි පිළිගනිමින් ඔහු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලද්දේ නම් කිංස්වුඩ් විදුහල මඟින් පමණක් මෙම බදු ඔප්පු ලියකියවිලි පිළිනොගැනීමට හේතුව කුමක්ද යන්නත් ඔහුගේ පුතුට ක්‍රිස්තියානි පදනම මත ඇති එකම හා ආසන්නතම පාසල කිංස්වුඩ් විදුහල පමණක් වන බැවින් අයදුම්පත්‍රය නැවත කැඳවන ලෙස ඉල්ලා සිටින බවත්, මේ සඳහා කොමිෂන් සභාවේ අවධානය යොමු කර සාධාරණ විසඳුමක් ලබා දෙන ලෙස මෙම පැමිණිල්ල මඟින් ඉල්ලා සිටින බවද සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

වගඋත්තර පාර්ශවීය සැලකිරීම :-

පැමිණිල්ලට අදාළ වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් වාර්තාවක් යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් යන ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, නමුත් එය මූලික අවස්ථාවේදීම ප්‍රතික්ෂේප වූ බවත්ය. එයට හේතු වී ඇත්තේ ඉල්ලුම්කරුගේ හෝ ඔහුගේ කාලත්‍රයා නමින් පදිංචිය සනාථ කිරීමට ඔප්පුවක් ඉදිරිපත් කර නොතිබීමත්, ඉදිරිපත් කර තිබූ වාර්ෂික බලපත්‍රය 1990.11.01 දින සිට එක් වසරකට පමණක් සීමා වූ ශිලා ද සිල්වා නැමැත්තියකට නිකුත් කරන ලද්දක් වීම හා ඒ අනුව බදුකාලය අවසන්ව තිබීමත් මත පැමිණිලිකරුගේ පදිංචිය සනාථ නොවීම වන බවද සඳහන් කර ඇත.

විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 1 වන වසරට ඇතුළත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් ගණය යටතේ අයදුම් කර ඇති අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවන බව දන්වා සම්මුඛ පරීක්ෂණයට නොකැඳවා අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ. 2017 වර්ෂයේ පාසැල්වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීමේ අංක 17/2016 දරණ චක්‍රලේඛණයෙහි අයදුම්කරුවකුගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවේ නම් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත. සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරු කැඳවූයේ නම් හිමිකම් තහවුරු නොකිරීම මත අදාළ ලකුණු ප්‍රමාණය අහිමි වුවද ඉතිරි ලකුණු ප්‍රමාණය පැමිණිලිකරුට ලබාගත හැකිව තිබූ නමුත් එම අවස්ථා අහිමිකර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පැමිණිලි පාර්ශවයට අගතියක් කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලි පාර්ශවය විසින් පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති වාර්ෂික බලපත්‍රය පැමිණිලි පාර්ශවයේ මවට මහනුවර මහ නගර සභාව විසින් නිකුත් කර ඇති අතර වාර්ෂික බලපත්‍රය වසරකට නිකුත් කර වසරින් වසර වර්ෂයට අදාළ බදු මුදල් ගෙවීම හේතුවෙන් අවලංගු නොවන බැවින් මේ දක්වාම එය නීත්‍යානුකූල බලපත්‍රයක් වන බව නිරීක්ෂනය වේ. ඒ අනුව අදාළ බලපත්‍රය පැමිණිලි පාර්ශවයේ මවට හිමි නීත්‍යානුකූල බලපත්‍රයක් බැවින් ඊට අදාළ ලකුණු ප්‍රදානය කිරීමේ හැකියාවක් පවතින බවද නිරීක්ෂණය වේ. තවද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා මහනුවර මහ නගර සභාව මගින් නිකුත් කර ඇති 2016.08.03 දිනැති ලිපිය මගින්ද දන්වා ඇත්තේ, පැමිණිලිකරුගේ මව ඉඩම් සමීක්ෂණ ලැයිස්තුවේ අංක 27 යටතේ ලියාපදිංචි වී ඇති බවත්, අදාළ ඉඩම නියමානුකූල කරනු ලබන අවස්ථාවකදී අදාළ ඉඩම බදු ලබා දීම සඳහා සලකා බලනු ලබන බවත්ය. ඒ අනුව පැමිණිලිකරුගේ මවට අදාළ පදිංචි ස්ථානයේ හිමිකම පවතින බව තහවුරු වන බැවින් ඒ සඳහා ලබාදිය යුතු ලකුණු ප්‍රමාණය ප්‍රදානය කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැකියාවක් තිබියදී එය ලබා නොදීම පැමිණිලිකරුට සිදු කරන ලද අගතියක් බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ හිමිකම් තහවුරු නොවන බව සලකා සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති අතර, එමගින් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිය උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විශේෂිත සම්මුඛ පරීක්ෂණයකට පැමිණිලිකරු කැඳවා ලබාගන්නා ලකුණු අනුව පැමිණිලිකරුගේ දරුවා කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම ලබන්නේ නම් 2019 වර්ෂයේ තෙවන ශ්‍රේණියට (2017 පළමු ශ්‍රේණිය) දරුවා ඇතුළත් කර ගැනීමට පියවර ගත යුතුය.

2019.09.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් : 01. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/